# අපේ කාලේ කතන්දර



රසික සූරියආරච්චි

# පරකන්දෙණියේ ධම්මවංශාභිධාන කතා වස්තුව



එකල්හි අප මහා පස්වෙනි ජෝර්ජ් මහ රජාණන්දෑ හිරු නොබසින අධිරාජයේ දැහැමෙන් සෙමෙන් රාජ්‍යය විචාරමින් කල් යවනා කාලයේ, ඉන්දීය සයුරේ කඳුළු බිඳුව නම් වූ විරුදවලි ලද එක්තරා කොදෙව්වක බස්නාහිර පළාතේ සියනෑ කෝරළයේ පරකන්දෙණිය නම් වූ පසල් දනව්වේ විසූ කෙළෙඹි පුත්‍රයෙකි. තම බිරින්දෑ සමග කාලයක් තිස්සේ පවුල් කෑවා වුව ද, දරුවෙකු නොමැති වූ නිසා, ඔහු විසුවේ තරමක කනස්සලෙන් බව අද අපට සිතිය හැක. මේ කාරණය නිසා හෝ වෙනත් හේතු කාරණා නිසා හෝ මේ අඹුසැමි යුවළ අතර නොහොඳ නෝක්කාඩු, අමනාපකම්, හැල හැලැප්පීම්, වලි හෝ කචල් තිබුණෝ දැයි පාරම්පරික ප්‍රවාදයෙහි සඳහන් නොවේ. එසේ වතුදු, මේ කෙළෙඹි පුත්‍රයාට තම බිරිඳ ගේ කනිටු සොහොයුරිය සමග යම් කිසි පහිරු-පාසානයක්, අනියම් සබඳකමක්, ඇති කරගන්නට මූලික වූ යම් යම් කාරණා තියෙන්නට ඇත.

**බුද්ධදස තරුණයා වාසය කළ පසල්දනව්වට ගව්වක් පමණ දුරින් පිහිටි සූරිගම නම් වූ ග්‍රාමයේ පිහිටි පන්සල අයත් වුයේ රාමඤ්ඤ නිකායට ය. මේ නිකාය වනාහී පෙරකී තායිලන්ත නිකාය මෙන් කුල-මල, වත-ගොත, පෙළපත, කසාද සහතික යනාදිය මත මහණකම දෙන නිකායක් නොවේ.**

එකල ඒ ධර්මද්වීපයෙහි ප්‍රීති ය, මිතුරි ය, කොන්ඩොම් ය, මෝනිං ආෆ්ටර් ෆිල් ය යනාදී විවිධාකාර උපත් පාලන විධි-ක්‍රම නොතිබුණි. එසේ තිබුණෝ වුව ද, මේ පටලැවිල්ලට ඒවා අවැසි නොවන්නට ද ඉඩ තිබුණි.

මෙසේ කාලයක් කොටු පනිමින් සිටියායින් අනතුරුව, තම අනියම් බිරිඳ හෙවත් ස්පෙයාවීලය ගැබ්ගත් කල් හී අප කෙළෙඹි පුත්‍රයාණෝ කල්පනා කරන්නේ, මා මේ නූපන් දරු ද, උන් මෑණියන් ද දෙඇස මෙන් රකින්නෙමියි සිතා අදිටන් කොට ගෙන තම පසල් දනව්වේ අනිත් කෙළවර ගෙපැලක් අටවා තම ගැබ්බර පෙම්බරිය එහි පදිංචි කරාවාලූ හ.

මෙසේ දස මස් ඇවෑමෙන් පින්වත් පුත් කුමරුවෙක් එමවිකුසෙන් මෙලොවට ජනිත විය. හේ සූරියආරච්චිගේ බුද්ධදස ලෙසින් නම් ලද්දේ ය.

තම පියා සපයා දී, මව උයා පිහා දෙන අහරින් මනාව පෝෂණය ලද එකුමරු තෙමේ කෙමෙන් වැඩී පුෂ්ටිමත්, බුද්ධිමත් දරුවෙකු බවට පත්විය. ගමේ පාසලේ ගුරුන් ගේ සිත් දිනා ගනිමින් අකුරු උගත්තේ ය.

මෙලෙස තව කලක් ගත විය.ආරෝහ පරිණාහ උත්තුංග දේහයෙන් ද, මනා ඡවි කල්‍යානයෙන් ද, සිය පිය පාර්ශවයෙන් හොඳින් සම්මාදම් ලද පිරිපුන් සඳක්වන් පින්වන්ත මුහුණෙන් ද යුතු වූ අප බුද්ධදස තරුණ තෙමේ, ජන්මාන්තර පුරුද්දක් නිසා දෝ කල්පනා කළේ මහණ දම් පිරීමටයි. බුද්ධදස කුමරා වාසය කළ නිවස පිහිටි පසල් දනව් ග්‍රාමයට අයිති වූයේ නුදුරින් තිබූ කොස්සින්න රජමහා විහාරයේ හතර පේරුවටයි. මෙකී කොස්සින්න රජමහා විහාරය වනාහී තායිලන්ත නිකායේ අස්ගිරි චැප්ටරයට අයත් වූවකි. ඒ නඩයේ පන්සලක මහණ දම පුරන්නට වරම් ලැබෙන්නේ උභය කුල පාරිශුද්ධ අයට පමණි. එනම් මූලිකව ම. මහණ දම් අ-ජ්ක්ෂිත පින්වත් කුමරුවා ගේ මව්පිය දෙපළ ම ගොවිගම කුලයේ විය යුතු ය. එපමණක් නොව කුමරුවා ගේ පැටිකිරිය ද පාරිශුද්ධ විය යුතුය.

අප කතානායක බුද්ධදසයන්ට නොතිබුණෝ මේ දෙවැනි සුදුසුකමයි. සිය මව, සිය පියා ගේ නීත්‍යානුකූල බිරිඳ නොව ස්පෙයාවීලය වූ හෙයින් ගමේ පන්සලේ සංඝරාජලාට අනුව බුද්ධදස යනු අවජාතකයෙකු විය. එද සුනීතලා, සෝපාකලා, අංගුලිමාලලා මහණ දම් පිරුවේ ද, නන්දලා, ආනන්දලා, රාහුලලා සමග එක ම ශාසනයේ, එක ම දෙව්දම් වෙහෙරේ, එක ම අනාථපිණ්ඩිකස-ˀසාරාමයේ බව මෙකී මහණුන්ට අමතක වී තිබුණි.

එයින් උකටලී වූයේ අපේ බුද්ධදසයන් නොවේ.

බුද්ධදස තරුණයා වාසය කළ පසල්දනව්වට ගව්වක් පමණ දුරින් පිහිටි සූරිගම නම් වූ ග්‍රාමයේ පිහිටි පන්සල අයත් වුයේ රාමඤ්ඤ නිකායට ය. මේ නිකාය වනාහී පෙරකී තායිලන්ත නිකාය මෙන් කුල-මල, වත-ගොත, පෙළපත, කසාද සහතික යනාදිය මත මහණකම දෙන නිකායක් නොවේ. එසේ හෙයින්, අප බුද්ධදසයන් ගේ මහණදම් පුරන ප්‍රාර්ථනය ඒ ආකාරයෙන් ම ඉෂ්ටප්‍රාප්ත වී ය. හේ පරකන්දෙණියේ ධම්මවංශ නමින් පැවිදි දිවියට ඇතුළත් විය.

එතැන් සිට මෙම වෘතාන්තය ඉතා කෙටියෙන් පවසන්නේ නම් මෙසේ ය. මනා ලෙස තම පිරිවෙන් අධ්‍යාපනය නිමවා ප්‍රාචීන, පණ්ඩිත ආදී උපාධි ලැබූ ධම්මවංශ හිමියෝ පසු කලෙක ඉන්දියාවේ කල්කටා විශ්ව විද්‍යාලයට ඇතුළත්ව එහිදී ශ්‍රාස්ත්‍රවේදී (බී.ඒ.) සහ ශ්‍රාස්ත්‍රපති (එම්.ඒ.) උපාධි ලබා යළි සිරිලකට වැඩම කොට සූරිගම නාගර්ජුන පිරිවෙනේ පරිවේනාධිපති ලෙස සඟ පරපුරට ද, සුමධුර ධර්ම කථිකයෙක් ලෙස උපාසක, උපාසිකා පරපුරට ද සේවය සලසමින් වැඩ වාසය කරමින් හිඳ, සංඝ නායක තනතුරකින් ද පිදුම් ලදුව, පසු කලෙක තම ආයුෂහරණය වූ කල් හී අපවත් වී වදාළ හ.

**ප.ලි.**

**විසිවන සියවස මුල් කාලයේ ලක්බිම පැවති බුද්ධ ශාසනයේ පැවති අජූත නිකාය භේදය ගැන විස්තර දැන ගැනීමට අවශ්‍ය නම්, පියදස සිරිසේන ලියූ විමලතිස්ස හාමුදුරුවන් ගේ මුදල් පෙට්ටිය නමැති කෘතිය කියවන්න. වසර සියයකටත් පසුව තවමත් ඒ තත්වය බොහෝ දුරට නොවෙනස්ව පවතින බව පසුගිය දූ මහනුවර මගුල් මඩුවේ දී පැවැත්වුණු කැප්පෙටිපොළ නිළමේට අලවා තිබූ ත්‍රස්තවාදී ලේබලය ගැලවීමේ ෂෝ එකේ දී, සිදු වී ඇතැයි පැවසෙන නිකාය පිළිබඳ අජූත කේසය නිසා අපට වටහා ගත හැක. වසර කිහිපයකට කලින් මා ලියූ මේ ලිපිය යළි සකසා පළ කරන්නට සිතුණේ ඒ නිසා ය.**

සුභාවිත ගීතයේ අන්තර්ජාල නවාතැන
www.thisara.com